*සැ. යු.* - 2022.03.25 දින පළ වූ අංක 2273 දරන *ගැසට් පත්‍රයේ* II, III සහ IV(අ) කොටස් පළ නොවී ය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,274 - 2022 අප්‍රේල් මස 01 වැනි සිකුරාදා - 2022.04.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 328 |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 329 |

*සැ. යු.*- (i) කාර්මික ආරවුල් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත 2022 මාර්තු මස 25 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) වෘත්තීයවේදීන්ගේ ප්‍රජා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2022 මාර්තු මස 25 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2022 අප්‍රේල් මස 22 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 අප්‍රේල් මස 08 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

මීගමුව දිසා අධිකරණයේ දී ය

නඩු අංකය : MB 3715/16
ස්වභාවය : උකස්
කාර්ය පටිපාටිය : සාමාන්‍ය
වටිනාකම : 12,00,000/-
මි. දි. ඇස්. අංක : 97/2019

කොස්වත්ත ලියනගේ ජූඩ් සුරන් ඕෂධී අප්පුහාමි,
අංක 296/බී, දළුපත, මීගමුව.

...................*පැමිණිලිකරු.*

*එදිරිව*

බෝඹුවල දේවගේ නිරූපා කාන්තිලතා,
අංක 91, ලුවිස් පෙදෙස,
මීගමුව.

.....................*විත්තිකාරිය.*

ඉහත අංකය දරන නඩුවේ වර්ෂ 2018 ක්වූ සැප්තැම්බර් මස 14 වැනි දිනැති තීන්දු ප්‍රකාශය අනුව ඉහත කී විත්තිකාරිය විසින් පැමිණිලිකරු වෙත අයකරගන්නට කියා නියමකොට තීන්දු ප්‍රකාශය කරන ලද රුපියල් ලක්ෂ එකොළහක (රු. 11,00,000/-) මුදලක් සහ එකී මුදල මත වර්ෂ 2016 ක් වූ මාර්තු මස 11 වැනි දින සිට වර්ෂ 2018 ක් වූ සැප්තැම්බර් මස 14 වැනි දින දක්වා මසකට සියයට තුනක් (03%) බැගින් පොලියද තීන්දු ප්‍රකාශයේ සඳහන් මුළු මුදල ගෙවා නිමවන දින දක්වා සම්පූර්ණ මුදල මත නෛතික පොලියද සහ නඩු ගාස්තු ද මේ දක්වා ඉහත නම් සඳහන් විත්තිකාරිය විසින් ගෙවා නොමැති බැවින් මෙම නඩුවේ ඇස්කිසි ක්‍රියාවේ යෙදවීමේ බලපත්‍රයක් නිකුත් කර අධිකරණයෙන් නැවත වැඩිදුරටත් ආඥාවක් ලැබෙන තෙක් මෙයට යා කොට ඇති උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ යම් ලෙසකින් පැවරීම, අන්සතු කිරීම හෝ වැය බරකට යටත් කිරීම ඒ සම්බන්ධයෙන් යම් ලේඛන ඉදිරිපත් කිරීම හෝ ලියාපදිංචි කිරීම හෝ උපදෙස් දීම එකී විත්තිකරු හට තහනම් කර එයින් වළක්වන ලද හෙයින් සහ එයින් හෝ ඉන් කොටසක් මුදලට හෝ ත්‍යාග වශයෙන් අන් ක්‍රමයකට ලබාගැනීම සියල්ලන්ට ම තහනම් කරන ලද හෙයින්,

**වර්ෂ 2022 ක් වූ අප්‍රේල් මස 22 වැනි දින ප. ව. 2.30 ට එකී දේපළ පිහිටි ස්ථානයේ දී පිස්කල් වෙන්දේසියේ විකුණනු ලැබේ.**

එකී වෙන්දේසියේ දී ඉහළම ලංසු තබන්නා ගැනුම්කරු වන අතර වෙන්දේසිය අවසන් වූ වහාම ගැනුම්කරු විසින් මුළු ගැනුම් මිලෙන් 25% ක මුදලක් ද, පිස්කල් ගාස්තු ද, රජයට අයවිය යුතු ගාස්තු, වෙන්දේසි ගාස්තු, *ගැසට්* පත්‍රයේ ගාස්තු, සහ පුවත්පත් වල ප්‍රසිද්ධ කිරීමේ වියදම් ද, අනෙකුත් ප්‍රචාරක කටයුතු සඳහා වියදම් ද එවෙලේම මුදලින් මා වෙත ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ. ගැනුම් මිලෙන් 75% ක් වූ ඉතිරි මුදල දින 30 ඇතුළත මීගමුව දිසා අධිකරණයේ ඉහත කී අංක දරන නඩුවට තැන්පත් කළ යුතු ය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ, කටාන ප්‍රාදේශීය සභා සීමාව තුළ, කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාල සීමාව තුළ, අංක 92 දකුණු කිඹුලාපිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයට අයත්, අලුත්කුරු කෝරළයේ, දූනගහ පත්තුවේ, කිඹුලාපිටිය පිහිටි මාලිගා ගොඩැල්ල කියන ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. අබේසුන්දර විසින් මැන සාදන ලද අංක 1102 සහ 2000.05.07 දින දරන පිඹුර ප්‍රකාර එකී පිඹුරේ නිරූපිත කැබලි අංක බී නමැති ඉඩමට මායිම් එනම් උතුරට :- කැබලි අංක ඒ දරන කොටසද, නැගෙනහිරට:- අංක 104 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 19 දරන අඩි 15 ක් පළල පාරද, දකුණට :- අංක 104 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 14 දරන කොටසද, බස්නාහිරට : පී. සීමන් ප්‍රනාන්දු සහ තවත් අයට අයිති ඉඩමද යන මායිම් තුළ පිහිටි පර්චස් දහනවයයි දශම හතක් (අ:0, රූ:0 පර්:19.70) විශාල ඉඩම සහ ඊට අයිති ගහකොළ, පලතුරු, ගොඩනැගිලි ආදි සියලු දේත් සමගය. මෙම ඉඩම මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක H 25/67 දරන පත් ඉරුවේ ලියාපදිංචි වී ඇත.

අංක 104 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 19 දරන අඩි 15ක් පළල පාරේ මාර්ග අයිතිය ද සමග වේ.

*දේපලට පිවිසීම.*- මීගමුව කොළඹ ප්‍රධාන මාර්ගයේ තෙල්වත්ත හන්දියෙන් කිඹුලාපිටිය ප්‍රධාන මාර්ගයේ කිඹුලාපිටිය පල්ලිය පසුකර 500m පමණ ඉදිරියට ගොස් දකුණුපස පළමු බුදුපිළිමය අසලින් දකුණට හරවා අස්වැද්දුම ලිඳ පාරේ 300 m පමණ යන විට දකුණු පස පාරට කලින් ගෙවල් 2 කට පෙර ඇති ඉඩම.

එම්. එම්. කේ. ශ්‍රියාන්ත,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
ප්‍රොබේට් නිලධාරි සාම විනිසුරු,
දිසා අධිකරණය,
මීගමුව.

වර්ෂ 2022 ක් වූ මාර්තු මස 11 වැනි දින දී ය.

04-33

# විවිධ දැන්වීම්

## වීමංසා ධම්මගුප්ත පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

ගුණතිලක රාජපක්ෂ වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ අංක 53 (1) දරන ස්ථාවර නියෝගය යටතේ "වීමංසා ධම්මගුප්ත පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි'', යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී භාරකාරත්වය සංස්ථාගත කිරීමයි :-

(අ) ලෞකික හා ලෝකෝත්තර වශයෙන් යහපත් ඵලදයී ජීවන තත්ත්වයක් උදකර ගැනීම උදෙසා ආධ්‍යාත්මික, අධ්‍යාපනික, සමාජ, සංස්කෘතික හා ආර්ථික යන චතුර්විධ අංශ, බෞද්ධ මාර්ගෝපදේශ අනුව සංවර්ධනය කර ගැනීමට අවශ්‍ය දයකත්වය සහ සහයෝගය සැපයීම ;

(ආ) බෞද්ධ ජනයා ත්‍රිවිධ පුණ්‍ය කටයුතු කෙරෙහි යොමු කිරීමෙහිලා අවශ්‍ය ක්‍රමෝපායයන් යෙදීම ;

(ඇ) මානසික සුවතා වර්ධන මධ්‍යස්ථානයක් සමගින් නිවාඩු නිකේතනයක් පවත්වාගෙන යාම ;

යනාදිය වේ.

ගුණතිලක රාජපක්ෂ,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
මහනුවර දිස්ත්‍රික්කය.

04-24

---

## (කොළඹ දී පැවැත්වෙන) සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය

මොරටුව, ගාලු පාරේ, අංක 211/6/2 දරන ස්ථානයේ,
ටී. ජී. එන්. වෙන්චර්ස් (ප්‍රයිවේට්) ලිමිටඩ් සමාගම,
ගණන් බේරා වසා දැමීමේ ඉල්ලීමක කාරණයේ දී ය.

නඩු අංකය : සීඑච්සී/003/2022/සීඕ
ස්වභාවය : ගණන් බේරා වසා දැමීම
පටිපාටිය : සාමාන්‍ය

සෙන්ට්‍රිකෝ සිකියුරිටි (ප්‍රයිවේට්) ලිමිටඩ්,
කාර්ය අංක 16, වෝල්ටර් ගුණසේකර මාවත,
නාවල.

*...................පෙත්සම්කරු.*

ඉහත නම සඳහන් සමාගම, කොළඹ වාණිජ මහාධිකරණය විසින් ගණන් බේරා වසා දැමීම සඳහා වූ පෙත්සමක් එම අධිකරණය වෙත වර්ෂ 2022 ක් වූ ජනවාරි මස 31 වැනි දින දී නාවල, වෝල්ටර් ගුණසේකර මාවතේ, අංක 16 දරන ස්ථානයේ සෙන්ට්‍රිකෝ සිකියුරිටි (ප්‍රයිවේට්) ලිමිටඩ් සමාගම විසින් පිළිගන්වන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ. තව ද එකී පෙත්සම අධිකරණය ඉදිරියේ වර්ෂ 2022 ක් වූ මැයි මස 17 වැනි දින විභාග කිරීමට නියම කර ඇති බවත්, එකී පෙත්සම සම්බන්ධයෙන් ආඥවක් කිරීමට, ආධාර කිරීමට හෝ විරුද්ධ වීමට කැමැති ඒ සමාගමේ යම් ණයහිමියෙකු හෝ ආධාරකරුවෙකුට විභාග කරන අවස්ථාවේ දී පෞද්ගලිකවම හෝ තම නීති උපදේශක හෝ නීතිඥවරයා මාර්ගයෙන් ඒ සඳහා පෙනී සිටිය හැකි බවත්, පෙත්සමේ පිටපතක්, එය ඉල්ලා සිටින එකී සමාගමේ යම් ණයහිමියෙකුට හෝ ආධාරකරුවකුට ඒ සඳහා නියමිත ගාස්තුව ගෙවීම මත පහත අත්සන් කරන අය විසින් සපයනු ලබන බවත්, මෙයින් දැනුම් දෙනු ලැබේ.

*අත්සන් කළේ :* නීතිඥ එරංගා පින්නදූව,
අංක 36/1බී5,
නීතිඥ සංගම් කාර්යාල සංකීර්ණය,
ශාන්ත සෙබස්තියන් කන්ද, කොළඹ 12.

*සැලකිය යුතුයි.-* ඒ පෙත්සම විභාග කරන අවස්ථාවේ දී පැමිණ සිටීමට අදහස් කරන යම් තැනැත්තෙකු ඉහත නම සඳහන් එරංගා පින්නදූව වෙත එසේ පැමිණීමේ තම අදහස පිළිබඳ ලිඛිත දැන්වීමක් බාරදීම හෝ තැපැල් මගින් එවීම කළ යුතුය. ඒ දැන්වීමෙහි ඒ තැනැත්තාගේ නම සහ ලිපිනය හෝ ව්‍යාපාර ආයතනයක් නම්, ව්‍යාපාර ආයතනයේ නම සහ ලිපිනය ප්‍රකාශ කරනු ලැබ, ඒ පුද්ගලයාගේ හෝ ව්‍යාපාර ආයතනයේ අත්සන හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ නීතිඥවරයා (ඇතොත්) නීතිඥවරයාගේ අත්සන තිබිය යුතු අතර, එය බාරදීම හෝ තැපැල් කරන්නේ නම්, වර්ෂ 2022 ක් වූ මැයි මස 16 වැනි දින සවස 6ට පෙර ඉහත නම සඳහන් අයට ලැබෙන සේ එවිය යුතුය.

නීතිඥ එරංගා පින්නදූව,
අංක 36/1බී5,
නීතිඥ සංගම් කාර්යාල සංකීර්ණය,
ශාන්ත සෙබස්තියන් කන්ද, කොළඹ 12.

වර්ෂ 2022ක් වූ මාර්තු මස 25 වැනි දින දී ය.

04-56

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### *තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල | තැපැල් ගාස්තුව |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2022 වර්ෂය** | | | |
| අප්‍රේල් | 2022.04.01 | සිකුරාදා | 2022.03.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.04.08 | සිකුරාදා | 2022.03.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.04.12 | අඟහරුවාදා | 2022.04.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.04.22 | සිකුරාදා | 2022.04.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.04.29 | සිකුරාදා | 2022.04.12 | අඟහරුවාදා | දහවල් | 12.00 |
| මැයි | 2022.05.06 | සිකුරාදා | 2022.04.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.05.13 | සිකුරාදා | 2022.04.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.05.20 | සිකුරාදා | 2022.05.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.05.27 | සිකුරාදා | 2022.05.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූනි | 2022.06.03 | සිකුරාදා | 2022.05.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.06.10 | සිකුරාදා | 2022.05.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.06.17 | සිකුරාදා | 2022.06.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.06.24 | සිකුරාදා | 2022.06.10 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.